**නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතිය - 2013**

---

නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2009 ජූලි 23 දින එළඹි අංක පීඊඑෆ්-එෆ්එස්පී-5-එල්කේ දරන ප්‍රදාන ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුමට අනුව, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වූ අතර, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විය. කෙසේ වුවද 2012 අප්‍රේල් 04 දින ප්‍රදාන ගිවිසුමට කරනලද සංශෝධන අනුව, ව්‍යාපෘතියේ නව ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වනුයේ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයයි. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ සුනාමි බලපෑමට ලක්වූ ගෝලීයව වැදගත්වන පරිසර පද්ධති පිළිබඳ ප්‍රධාන ප්‍රවාහය ප්‍රතිස්ථාපනය හා කළමනාකරණ සංරක්ෂණය සඳහා තිරසාර ජීවනෝපායයන්ට සහායවීම සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට යොමුකිරීම සහ දේශගුණික විපර්යාසයන්ගෙන් පීඩාවට පත්වීම අවම කිරීමයි. ප්‍රදාන ගිවිසුමට අනුව, ගෝලීය පාරිසරික පහසුකම් මූල්‍යායනය වූ එ ජ ඩො 7,269,915 කින් හා සහ - මූල්‍යායනය වූ එජඩො 7,569,450 කින් සමන්විත ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 14,839,365 ක් වේ. එජඩො 7,569,450 ක් වූ සහ-මූල්‍යායනය , ශ්‍රී ලංකා රජයෙන් එජඩො 430,300 කින්, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලෙන් එජඩො 7,083,650 කින් හා ලෝක සංරක්ෂණ සංගමයෙන් එ ජ ඩො 55,500 කින් සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 සැප්තැම්බර් 10 දින ආරම්භ කරන ලද අතර, 2015 සැප්තැම්බර් 10 වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට

උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂාකිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරුකිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂාකිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලනකල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරුවනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයනලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරනලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව.

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ

ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙනයනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන
-------------------

4.1 මූල්‍ය කාර්යසාධනය
---------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.95,843,611 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.181,926,825 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, 2010 සැප්තැම්බර් 10 සිට 2012 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වියදම, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| වර්ගය | 2013 වර්ෂය සඳහා වියදම | 2010 සැප්තැම්බර් 10 සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා වියදම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| තාක්ෂණ සහාය උපදේශන | 6,641,510 | 3,881,735 | 10,523,245 |
| පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය | 36,685,744 | 24,554,469 | 61,240,213 |
| උපයුක්තය | 41,845,079 | 15,536,289 | 57,381,368 |
| වාහන හා උපකරණ | 1,253,230 | 26,107,715 | 27,360,945 |
| මෙහෙයුම් හා නඩත්තුව | 9,418,048 | 16,003,006 | 25,421,054 |
| එකතුව | 95,843,611 | 86,083,214 | 181,926,825 |

4.2 විශේෂ (ඩොලර්) ගිණුම

මුල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 321,765 | 40,915,906 |
| එකතු කළා :- ඌනපූරණයන් | 1,000,000 | 128,547,150 |
| විදේශ විනිමය වාසිය | - | 2,044,725 |
| අඩු කළා :- ආපසු ගැනීම් | (705,720) | (90,958,035) |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 616,045 | 80,549,746 |

## 5. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 5.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මුල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මුල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය ලේඛනයෙන් කරන ලද වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 14.50 | 1,929.1 | 338.03 | 0.70 | 91.28 | 1.32 | 172.8 |
| ශ්‍රීලංර | 0.43 | 55.9 | 5.65 | 0.03 | 4.56 | 0.07 | 9.1 |
| එකතුව | 14.93 | 1,985.0 | 343.68 | 0.73 | 95.84 | 1.39 | 181.9 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩ සැලැස්ම අනුව, ව්‍යාපෘති කාර්යයන් වෙනුවෙන් 2010 සිට 2013 දක්වා වර්ෂ 4 ක කාල පරිච්ඡේදය සඳහා රු.883,360,000 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වුවද මුළු වෙන්කිරීම් වලින් සියයට 20 ක් නියෝජනය වන එකතුව රු.181,926,825 ක මුදලක් පමණක් 2013 වර්ෂය අවසානය දක්වා උපයෝජනය කර තිබුණි.

(ආ) 2013 වර්ෂය තුළ ව්‍යාපෘති කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කළ මුදල, එම කාර්යයන් සඳහා වෙන්කරන ලද මුළු අරමුදලින් සියයට 22 කින් නියෝජනය වූ අතර කළමනාකරණ කාර්යයන් සඳහා උපයෝජනය කළ මුදල එම කාර්යය සඳහා වෙන්කරන ලද මුදලින් සියයට 158 කින්

නියෝජනය වුයෙන්, සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ කාර්යයන් සඳහා විධිමත් පරිදි අමතා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| කාර්යයන් | වෙන්කළ මුදල | දරන ලද වියදම | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | |
| ව්‍යාපෘති කාර්යයන් සඳහා වියදම | 330,030,000 | 74,183,601 | 22 |
| ව්‍යාපෘති කළමනාකරණ කාර්යයන් සඳහා වියදම | 13,650,000 | 21,659,009 | 158 |

(ඇ) තවද, ව්‍යාපෘති කාර්යයන් 20 ක් වෙනුවෙන් 2013 වර්ෂය තුළදී වෙන්කරන ලද රු.122,550,000 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු මුදලක් එම කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. වෙරළාශ්‍රිත ප්‍රදේශවල ජීවත්වන ජනයා සඳහා පාරිසරික සංරක්ෂණය නව විෂයයක් බවත්, එබැවින් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පෙර බොහෝ දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් ඔවුන්ට උපදෙස් ලබාදිය යුතු බවත් මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මා වෙත දන්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආරම්භයේදී සැලසුම් කළ මට්ටමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීය.

## 5.2 භෞතික කාර්සාධනය

### 5.2.1 ව්‍යාපෘති කාර්යයන් පිළිබඳ ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරි සැලැස්ම අනුව, 2013 මාර්තු 31 ට පෙර නිම කළ යුතු වු ව්‍යාපෘති කාර්යයන් 7 ක් සඳහා රු.210,009,600 කට සමාන එකතුව එජඩො 1,640,700 ක මුදල් වෙන්කර තිබුණි. තවද, එකතුව එජඩො 1,683,627 ක් වු ( දළ වශයෙන් රු.215,504,256) මුදල් වෙන්කරන ලද වෙනත් කාර්යයන් 12 ක් 2013 දෙසැම්බර් අවසානයට පෙර නිමකළ යුතු විය. කෙසේ වුවද එවැනි කිසිදු කාර්යයක් 2013 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

### 5.2.2 කොන්ත්‍රාත් පරිපාලනය

**(අ) කෝමාරි කලපුව පුනරුත්ථාපනය කිරීම හා කොන්ක්‍රීට් කණු ස්ථාපිත කිරීම**

කෝමාරි කලපුව ගැඹුරු කර හැරීම සඳහා ව්‍යාපෘති කාර්යාලය විසින් පොතුවිල්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.1,170,180 ක මුදලක් මුදාහැර තිබු අතර කෝමාරි කලපුවේ පුනරුත්ථාපන වැඩ සිදුකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි සමිතිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, කෝමාරි කලපුව පුනරුත්ථාපනය කිරීම 2012 ඔක්තෝබර් 10 දිනට හෝ ඊට පෙර නිම කළ යුතු වුවද, සමිතිය විසින් එම කාර්යයන් 2013 ජුලි 23 දින නිම කර තිබුණි. කෙසේ වුවද ගිවිසුමේ 5 වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තු රු.78,900 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

(ii) කෝමාරි කලපුව රක්ෂිත ප්‍රදේශය පිළිබඳව හඳුනා ගැනීමෙන් තොරව රු.414,003 ක පිරිවැයකට කෝමාරි කලපුව වටකර කොන්ක්‍රීට් කණු සවිකරන ලදි. එහි ප්‍රතිඵලයක්

ලෙස කණු 25 ක් ඉවත් කර වෙනත් ස්ථානයන්හි සවි කිරීම සඳහා අතිරේකව රු.19,403 ක් වැය කිරීමට සිදුවිය.

(ආ) මඩකලපුව පලමීනමඩුහි, කීනියඩි ටුනාහි ආරක්ෂක බැම්ම ඉදිකිරීම

---

කීනියඩි ටුනාහි ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.1,000,000 ක මුදලක් ව්‍යාපෘතිය විසින් මුදා හරින ලදි.

මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට පෙර විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබු බව නිරික්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂා කාලයේදී අත්තිවාරම සේදීයාම හේතුවෙන් ආරක්ෂිත බැම්මට හානි සිදුවීමේ අවදානමක් ඇත.

(ii) මන්මුනෙයි උතුර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් තොරතුරු අනුව, ඉහත ඉදිකිරීම් වැඩ සඳහා රු. 886,132 ක මුදලක් පමණක් වැය කර තිබු අතර, රු. 113,867 ක ශේෂය තැන්පතු ගිණුම්වල තබා තිබුණි. කෙසේ වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ලබාදී තිබු රු. 1,000,000 ක් වු සම්පූර්ණ මුදලම ඉදිකිරීම් වැඩ සඳහා වැය කර තිබු බව ව්‍යාපෘතිය විසින් වාර්තා කර තිබුණි.

**5.3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

අම්පාර ව්‍යාපෘති සම්බන්ධිකරණ කාර්යාලයේ පරිසර පද්ධති ප්‍රතිස්ථාපන උපයෝජන ඒකකය සඳහා 2013 ජුලි 01 දින බඳවා ගෙන තිබු නිලධාරියකු බඳවා ගත දිනයේ සිටම රාජකාරියට වාර්තා කර නොතිබුණි. කෙසේ වුවද 2014 පෙබරවාරි දක්වා රු. 84,333 ක මුදලක් එම නිලධාරියාට දීමනා ලෙස ගෙවා තිබුණි.